www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බෙනාසීර් භූටෝ ඝාතනය හමුවේ බුෂ් පරිපාලනය මුෂාරෆ්ගේ ආරක්ෂාවට තදියම් වෙයි

## In wake of assassination of Benazir Bhutto, Bush administration rushes to defense of Musharraf

**කීත් ජෝන්ස් විසිනි**
**2007 දෙසැම්බර් 28**

ජනවාරි 8 වන දිනට නියමිත ජාතික හා පලාත් මන්ත්‍රන සභා මැතිවරන ව්‍යාපාරයේ යෙදී සිටින අතරතුර පකිස්ථාන වේලාවෙන් 26 වන දින සවස, පකිස්ථානු ජනතා පක්ෂයේ (පීපීපී) "යාවජීව සභාපති" වූ ද අගමැති අපේක්ෂිකාව වූ ද බෙනාසීර් භූටෝ ඝාතනය කරනු ලැබින.

ඝාතනය සිදු කරන ලද්දේ පකිස්ථානු මිලිටරි මූලස්ථානය පිහිටි රටේ වඩාත්ම සුරක්ෂිත නගරයක් ලෙස සලකන රාවල්පින්ඩි හි දීය.

ඝාතනය සිදුවූ ආකාරය පිලිබඳව එකිනෙකට පටහැනි වාර්තා පලවේ. ඝාතකයා තෙමේම පුපුරුවා ගැනීමට පෙර භූටෝගේ ගෙලට හා කඳ පෙදෙසට වෙඩි තැබූ බව කියා සිටි සාක්ෂිකරුවන් උපුටා දක්වන බොහෝ වාර්තා දක්නට ලැබුනි. පිපිරුමෙන් අඩුම තරමින් තවත් 20 දෙනෙක් වත් ජීවිතක්ෂයට පත් විය. කෙසේ වුවද නිව් යෝර්ක් ටයිම්ස් පත්‍රය ජ්‍යෙෂ්ඨ පීපීපී නිලධාරීන්ට අනුව වාර්තා කලේ දෙවෙනි ඝාතකයා සිය දිවි නසාගන්නා බෝම්බ ප්‍රහාරය එල්ල කිරීමට පෙර වහලයක් මත සිටි ස්නයිපර් තුවක්කු කරුවෙකු භූටෝට වෙඩි තැබූ බවය.

අනෙක් ප්‍රධාන විරුද්ධ පක්ෂය විසින් සංවිධානය කල රැලියක්, බලයෙන් පහ කල අගමැති නවාස් ෂරීෆ් විසින් ඇමතීමට නියමිතව තිබුනු අතර, එදින ම ප්‍රහාරයට ලක් විය. පකිස්ථාන මුස්ලිම් ලීගයේ (නවාස්) ආධාරකරුවන් සිවුදෙනෙකු සනයිපර් තුවක්කුකරුවන් විසින් ඝාතනය කල අතර පස් දෙනෙකුට තුවාල සිදු විය.

භූටෝ ඝාතනය අල් කයිඩාවට හෝ එවන් වෙනත් ඉසලාමීය කන්ඩායමකට එක එල්ලේ ම පවරමින්, පරීක්ෂනය අවසන් යයි එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතය වහාම ප්‍රකාශ කලේ, පරීක්ෂනය කෙසේ වෙතත් අවශ්‍ය සාක්ෂි රැස් කිරීමටත් ප්‍රථම හා ඝාතනයේ ප්‍රධාන කරුනු තව මත් මතභේදයට තුඩුදී තිබිය දී ම ය.

පකිස්ථානයේ දේශපාලන යථාර්ථය සමඟ වනචර ලෙස විසංවාදී වන කට කැඩිච්ච ප්‍රකාශයක්, එක්සත් ජනපද වේලාවෙන් 28 වන දින උදේ ජනාධිපති ජෝර්ජ් බුෂ් විසින් කල අතර භූටෝ ඝාතනය "පකිස්ථානයේ ප්‍රජාතන්ත්‍රවාදයට වලකැපීමේ උත්සාහයක නිරත මිනීමරු අන්තවාදීන් විසින් සිදුකල බියගුලු ක්‍රියාවක්" බවත්, පකිස්ථානුවන් "බෙනාසීර් භූටෝගේ මතකයට ගරු කිරීම සඳහා ඇය සිය ජීවිතය එතරම් නිර්භීත ලෙස කැප කල ප්‍රජාතන්ත්‍රවාදය සඳහා දිගට ම කටයුතු කල යුතුව ඇතැයි" ද සඳහන් කලේය.

පසුව, ධවලමන්දිර ප්‍රකාශක ස්කොට් සටැන්සෙල් ප්‍රකාශ කලේ බුෂ් පකිස්ථාන ජනාධිපති පර්වේස් මුෂාරෆ් සමඟ ඉදිරි පැය ගනනාව තුල දුරකථනයෙන් කථාකිරීමට නියමිත බවත් පකිස්ථානු මැතිවරන ජනවාරි 8 වන දින පැවැත්විය යුතු යයි ඔහුට නොකියනු ඇති බවත් ය. "ඒ පිලිබඳ තීරනය පකිස්ථානුන් අතය."

ඩිමොක්‍රටික් පක්ෂ ජනාධිපති අපේක්ෂක බරක් ඔබාමා ද බුෂ් අනුගමනය කරමින් කථාකල අතර එක්සත් ජනපද මාධ්‍ය වහාම තානය ඩැහැගත්තේය. එනම්, භූටෝ ත්‍රස්තයට එරෙහි යුද්ධයේ වීර වරියකි, පකිස්ථාන ජනතාව මුෂාරෆ් හා මිලිටරිය විසින් අටවා ඇති මැතිවරන වටා රැලි විය යුතුය.

දේශපාලන විරුද්ධවාදීන්ට මාරක ප්‍රහාර එල්ල කිරීම සඳහා උසිගැන්වීම් ද ඇතුලු අමු අමුවේ මානව අයිතීන් උල්ලංඝනය කිරීමේ ලා මුෂාරෆ් තන්ත්‍රයේ අට වසරක වාර්තාවට හා, සන්නද්ධ ඉස්ලාමීය කන්ඩායම්වලට අනුග්‍රහය දක්වමින්, ඔවුන් සිය භූ දේශපාලනික හා දේශපාලනික උප්පරවැට්ටි සඳහා පාවිච්චි කිරීමේ ලා පකිස්ථානු මිලිටරි බුද්ධි අංශයේ වාර්තාවට, හිමිකම් කියද්දීත්, එක්සත් ජනපද මාධ්‍ය තුල, භූටෝ ඝාතනයට මුෂාරෆ් තන්ත්‍රයේ හෝ එය වටා සිටින කල්ලියක සම්බන්ධයක් තිබිය හැකිය යන්න ගැන වචනයක් හෝ සඳහන් නොවේ.

වොෂින්ටනය සමග නොරොක් වී සිටින මිලිටරි කෙරුමෙකුගේ රටක් තුල ප්‍රමුඛ දේශපාලන විරුද්ධවාදියෙකු ඝාතනය කල හොත් එවිට වොෂින්ටනය මීට බෙහෙවින් වෙනස් ප්‍රතිචාරයක් දක්වනු ඇති බවට යම් හෝ සැකයක් තිබිය හැකිද? එවන් අවස්ථාවක එක්සත් ජනපදයේ සමස්ත දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය ම එම පාලනයේ වැරුද්ද වෙත ඇඟිල්ල දිගුකරනු ඇත.

භුටෝ ඝාතනයට මුෂාරෆ් ආන්ඩුව ඍජුව ම සම්බන්ධ නොවූයේ නම් පවා, සිතා මතා නොතකා හැරීමේ එහි ආකල්පය මගින් ආන්ඩුව පෞද්ගලිකව එවැන්නක් ප්‍රාර්ථනා කලේය යන දැඩි සැකය දැනට මත් මතුව තිබේ. මිනිසුන් 140 කට මරු කැඳවමින් ඔක්තෝබර් 18 වන දින කරච්චි නුවර දී භුටෝ මරාදැමීම සඳහා එල්ල කල බහුවිධ බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් ආන්ඩුව ඇතුලත කොටස්වලටත් මිලිටරි බුද්ධි අංශයටත් භුටෝ ම ප්‍රසිද්ධියේ චෝදනා එල්ල කලාය.

ඔක්තෝබර් මැද පකිස්ථානයට යලි පැමිනීමට පෙර භුටෝ, සිය ජීවිතය විනාශ කිරීමේ අදහසින් කටයුතු කරන පුද්ගලයන් තිදෙදෙනෙකුගේ නම් ඇතුලත් ලිපියක් ආන්ඩුවට යොමු කලාය. භුටෝ කිසි විටෙකත් මෙම නම් ප්‍රසිද්ධියට පත් නොකල ද ඔවුන්, බුද්ධි කාර්යංශයේ අධ්‍යක්ෂ ජෙනරාල් ඉජාශ් ෂා ද ඇතුලු ප්‍රසිද්ධ පුද්ගලයන් විය.

ජනේල අඳුරු කල වෙඩි නොවදින රථයක් හා බෝම්බ පුපුරුවා හැරීමේ ඉලෙක්ට්‍රොනික් ඩෙටොනේටර් අවුල්කරන උපකරන ඇතුලු තමාගේ ඉතාමත්ම මූලික ආරක්ෂක අවශ්‍යතාවන් වත් සපුරාලීමට වත් ආන්ඩුව අපොහොසත්ව ඇතැයි පසුගිය සති කිහිපයේ ඇය නිතර පැමිනිල කලා ය.

ඇයගේ එක්සත් ජනපද ප්‍රකාශකයෙකු සඳහන් කලේ මරා දැමුනු පීපීපී නායිකාව, තමා මියගිය හොත් පකිස්ථාන ආන්ඩුව හා මිලිටරිය එහි වගකීම භාර ගත යුතු බව ඔහුට දැනුම් දී ඇති බවය.

එක්සත් ජනපද විදේශ සම්බන්ධතා කමිටුවේ සභාපති හා ඩිමොක්‍රටික් ජනාධිපති අපේක්ෂකත්වයට තරග කරන ජෝසෆ් බිඩෙන් සඳහන් කලේ භුටෝට විශේෂ ආරක්ෂාව ලබා දෙන ලෙස තමන් මුෂාරෆ් ආන්ඩුවෙන් පුද්ගලිකව ඉල්ලා සිටි නමුත් ඔහුගේ ඉල්ලීම නොතකා හල බවය.

ඉන් පෙනීයන්නේ, තමන් දරුනු අන්තරායකට මුහුනපා සිටින බව භුටෝ දැනගෙන සිටිය ද එක්සත් ජනපදය සමග තමන්ට පැවති සමීප සබඳතා හේතුකොට ගෙන ඇයට අරක්ෂාව සැලසෙනු අතැයි ඇය ගනන් බැලූ බවය. එහෙත් මෙහි දී ඇය තදින් ම පොට වරද්දා ගත්තාය.

## පකිස්ථානු 'ප්‍රජාතන්ත්‍රවාදය' පිලිබඳ මිථ්‍යාව

භුටෝගේ ඝාතනය ප්‍රශ්නයට බඳුන් කරන්නේ මුෂාරෆ්ගේ නායකත්වයෙන් යුත් මිලිටරි ආන්ඩුව කලක් තිස්සේ පොරොන්දු වී ඇති මැතිවරන පවත්වනු ඇත්ද යන්නයි. අඩුම තරමින්, ආන්ඩුව 26 වන දින ඝාතනය හා බෝම්බ භීෂනය, මැතිවරන ව්‍යාපාරයේ සෑම කටයුත්තක් ම මුලුමනින් ම තහනම් කිරීමට නිමිත්ත ලෙස යොදාගනු ඇතැයි බලාපොරොත්තු විය හැකිය.

මුෂාරෆ් කෙටි රූපවාහිනී වැඩ සටහනක පෙනී සිටිමින් දින තුනක ශෝක කාලයක් ප්‍රකාශ කල අතර ඝාතනය පිලිබඳව ඉස්ලාමීය ත්‍රස්තවාදීන්ට චෝදනා කලේය.

ආන්ඩුව විසින් මැතිවරන අපේක්ෂකයෙක් ලෙස පෙනී සිටීම පවා වලක්වා තිබෙන නවාස් ෂරීෆ්, ආන්ඩුව ජනවාරි 8 වන දින මැතිවරන පවත්වන්නේ නම් තම පක්ෂය ඒවා වර්ජනය කරන බව ප්‍රකාශ කරමින් භුටෝ ඝාතනයට ප්‍රතිචාර දැක්වීය.

පකිස්ථානයේ වඩාත් ම ප්‍රකට විරුද්ධ පක්ෂ නායිකාව ද දෙවරක් අගමැතිව සිටියාවූ ද භුටෝ ඝාතනය කිරීමෙන් සලකුනු කරන්නේ තරයේ ම ප්‍රෝඩාකාරී මැතිවරනවල ස්වභාවයයි. බුෂ් පරිපාලනය හා එක්සත් ජනපද මාධ්‍ය මගින්, මෙය "ප්‍රජාතන්ත්‍රවාදය දෙසට" තබන ලද ජනහිතකාමී පියවරක සලකුනකැයි කේවෙල් කරනු ලැබේ.

1999 මිලිටරි කුමන්ත්‍රනයකින් බලය පැහැරගත් මුෂාරෆ් දෙසැම්බර් 15 වන දින සති හයකට ඔහු විසින් ම පැනවූ හදිසි අවස්ථාව ඉවත් කලේය. තමා ජනාධිපති ලෙස යලි තේරී පත්වීමට පැවති සියලු නීතිමය හා ව්‍යවස්ථාමය බාධක ආඥාවක් මගින් අහෝසි වන පරිදි ඔහු හදිසි අවස්ථාව ප්‍රකාශ කර තිබුනි. කෙසේ වුවද නමට හැර, හදිසි අවස්ථාව දිගට ම ක්‍රියාත්මක වේ.

කුරිරු වාරන නියෝගවලට මාධ්‍ය යටත් කර තිබේ. ආන්ඩුවේ විරුද්ධවාදීන්ට යුද අධිකරනය හමුවේ දඬුවම් කල හැකිය. මැතිවරන පෙලපාලි හා සියලු ආන්ඩු විරෝධී උද්ඝෝෂන තහනම් කර තිබේ. මැතිවරන පිලිබඳව අවසන් නීතිමය අධිකාරය සතු ශ්‍රේෂ්ඨාධිකරනයේ හා මහාධිකරනයේ, මුෂාරෆ්ට ඇති තරම් පක්ෂපාතී නොවන විනිශ්චයකරුවන් නෙරපා හැර තිබේ.

එවන් සාපරාධී කුමන්ත්‍රන පොදුවේ සත්‍ය වන නමුත්, භුටෝ ඝාතනයේ නිර්මාතෘ කවරෙක් දැයි හරියට ම කිව නොහැක. පකිස්ථානු ජනතාවගේ බොහෝ කොටසකගේ නොවේ නම් වැඩි කොටසකගේ අදහස මුෂාරෆ් තන්ත්‍රය හා එහි මිලිටරි අනුග්‍රාහකයන් වගකිව යුතු බවයි. මරනීය තුවාල සහිතව භුටෝ ඇතුලත් කල ආරෝග්‍යශාලාව අසල රැස්ව සිටි කම්පාවට පත් පීපීපී ආධාරකරුවන් "මුෂාරෆ් බල්ලා" යනුවෙන් හඬ නැගූහ.

ආඥාදායකත්වයට පොදු නීත්‍යානුකුල බවක් පවරාදීමේ අපේක්ෂාවෙන් මුෂාරෆ් හා භුටෝ අතර බලය බෙදාගැනීමේ ගිවිසුමක් සඳහා මෙම වසර මුලදී බුෂ් පරිපාලනයේ සහයෝගය පල වීමෙන් පසුව අල්කයිඩා නායකයන් මෙන් ම තවත් විවිධ ඉස්ලාමීය සන්නද්ධ කන්ඩායම් භුටෝ අතුගා දමන බවට දිවුරුම් දුන්හ. එහෙත් මෙයින් ඉස්ලාම්වාදීන් ඝාතනය සිදුකල බවක් හෝ, ඔවුන් එසේ කලත්, මිලිටරි-ආරක්ෂක තන්ත්‍රය හා ආන්ඩුව ඇතුලත කොටස් ඊට අනුබල දුන්නේ හෝ එය උසිගැන්වූයේ නැති බවක් අදහස් නොකෙරේ.

අයුබ් ඛාන් හා යහියා ඛාන් අඥාදායකත්වයන් මියැදෙමින් තිබුනු අවධියේ බලය කරා නැගෙමින් සිටියදී, දුප්පත්කම හා අසමානතාවය කෙරෙහි පැවති ජනතා අතෘප්තියට වාචාල ලෙස ආයාචනා කිරීමේ හේතුව මත, පකිස්ථානු මිලිටරිය හා ධනපති පැලැන්තිය ඇතුලත බොහෝ කොටස් කවදාවත් පීපීපී යට සමාව නොදෙනු ඇත. හිටපු අගමැති හා පීපීපීයේ මූලාරම්භකයා ද, භුටෝගේ පියාද වූ සුල්ෆිකාර් අලි භුටෝ, පකිස්ථානයේ ව්‍යාපාරික හා ඉඩම් හිමි ප්‍රභූවේ ජයඝෝෂා හා තාලයට අනුව යමින් 1979 දී, සියා උල් හක් ගේ මිලිටරි පාලනය යටතේ එල්ලා මරන ලදී.

පසුගිය ග්‍රීෂ්මයේ හා ඉන්පසුව ද භුටෝ හා මුෂාරෆ් අතර බලය බෙදාගැනීමේ ගිවිසුමක් ඇතිකරලීමට බුෂ් පරිපාලනය සැලකිය යුතු ශක්තියක් වැය කරමින් උත්සාහ දරා තිබේ. ප්‍රෝඩාකාරී මැතිවරනවලින් පසුව ඔවුන් අතර ගිවිසුමක් ඇතිකල හැකිය යන බලාපොරොත්තුව තවමත් එය දරා සිටින බවක් ද පෙනී යයි. එහෙත් "හදිසි අවස්ථාව" පැවති මැතදී මුෂාරෆ්ට එය ලබාදුන් සහයෝගය හමුවේ ඇතිතරමින් පැහැදිලි වන්නේ මුෂාරෆ් හා මිලිටරිය තමන්ගේ හොඳම මිතුරන් ලෙස බුෂ් පරිපාලනය විසින් සලකනු ලබන බවය.

ආන්ඩුව, පකිස්ථානය ප්‍රජාතන්ත්‍රවාදය කරා මෙහෙයවමින් සිටින්නේය යන එක්සත් ජනපදයේ තකතිරු කියාපෑම් මෙන්ම, ආන්ඩුවට එය ලබාදෙන නොසැලෙන සහාය මගින් දිරිමත් වනු ඇත්තේ, භුටෝ සඳහට ම අවසන් කර දැමීමට ඉටා ගත් ජනාධිපති ම නොවේ නම් පකිස්ථානු මුස්ලිම් ලීගය (කිව්) තුල සිටින මුෂාරෆ්ගේ වගකීම් විරහිත හා නිර්දය දේශපාලන හෙංචයියන් හා මිලිටරියේ කොටස් පමනි.

පකිස්ථානයේ ජාතික පාර්ලිමේන්තුව තුල විශාලතම තනි පක්ෂය ලෙස මතුව ඒමේ ඉඩකඩ ඇතැයි ජනමත විචාරන මගින් අඟවා තිබූ පීපීපී හි දේශපාලන හිස ගසා දැමීමක් භුටෝ ඝාතනය තුල ගැබ්ව තිබේ. පාලක පෙලපතක පක්ෂයක් වන පීපීපී ය සුවිශේෂිතව ම යොමුවී ඇත්තේ බෙනාසීර් භුටෝ හා ඇගේ ඝාතනය කරන ලද පියාට කරන දේශපාලන ආයාචනයන් වෙතටය.

පීපීපී හි "යාවජීව සභාපති" ගේ ඝාතනය, වොෂින්ටනයේ වාසිය පිනිස, බලය සඳහා ශක්‍යතාවක් සහිත එදිරිවාදියෙකු තුරන් කිරීම මගින් මුෂාරෆ්ට හා ඔහුගේ තන්ත්‍රයට පැහැදිලිව ම වාසි සලසයි. කෙසේ වුවද, විදේශ සම්බන්ධතා කමිටුවේ සම්මේලනය කැඳවුම් කිරීමේ මාධ්‍ය සාකච්ඡාව තුල 26 වන දින සවස, ඝාතනයෙන් පාලන තන්ත්‍රයෙහි ඉතිරිව ඇති හා එය භුක්ති විඳින යම් හෝ විශ්වාසනීයත්වයක් ඉරා දමා සමාජ කැලඹීම් අවුලුවනු ඇතැයි එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතයේ කනස්සල්ල පලව තිබේ.

කරච්චි නුවර හා භුටෝගේ ජන්ම භූමිය වන සින්ඩ් පලාතේ නගරවල ද, පකිස්ථානයේ තවත් ප්‍රදේශවල ද, කැරලි පැන නැංගේය. බීබීසී වාර්තාවලට අනුව විරෝධතා මැඩීමට ආරක්ෂක හමුදා යෙදවීමත් සමඟ අඩු ම තරමින් එකොලොස් දෙනෙකු වත් මියගොස් තිබේ.

## එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ක්‍රියා කලාපය

සමකාලීන පකිස්ථානයේ දේශපාලන හා සමාජ-ආර්ථික දුස්සාධ්‍ය භාවයට අවසාන වශයෙන් වගකිව යුත්තේ අධිරාජ්‍යවාදය, සියල්ලට මත් වඩා එක්සත් ජනපද අධිරාජ්‍යවාදයයි. කම්කරු පන්තිය මෙන්ම දුගී ගම්බද පීඩිතයන්ද මෘග ලෙස සූරාකෑමෙන් ධනය ගොඩගසාගත් ධනපතියන් හා ඉඩම් හිමියන්ගේ තුනී ස්තරයක් සමඟ එක්ව ආන්ඩුවේ අධිකාරය දරන හමුදා නිලධරය එම ධනය බෙදා හදා ගන්නා රටකි එය.

පකිස්ථානු ප්‍රජාතන්ත්‍රවාදය ගැන එක්සත් ජනපද මාධ්‍ය මෑත දොඩවද්දී, යථාර්ථය නම් පකිස්ථානු ධනවාදය, මූලික සිවිල් නිදහස සහතික කිරීම ද, කාන්තාවට සමාන අයිතීන් ද, ළමා හා බන්ධන ගත ශ්‍රමය අහෝසි කිරීම ද අධ්‍යාපනය හා සනීපාරක්ෂන පහසුකම් ඇතුලු පීඩිත ජනතාවගේ අති මූලික ගැටලු විසඳීමට අසමත්ව තිබීමයි.

එක්සත් ජනපද ප්‍රභූවේ කොල්ලකාරී ආර්ථික හා භූ දේශපාලනික අවශ්‍යතාවන් ඉටුකර ගැනීමෙහි ලා, ඩිමොක්‍රටික් මෙන්ම රිපබ්ලිකානු පරිපාලනයන් ද, තිරශ්චීන මිලිටරි ආඥාදායකත්වයන් සෑම එකකට ම සහයෝගය දී තිබේ.

අන්තර් සම්බන්ධිත ක්‍රියාවලීන් දෙකක් පකිස්ථානු ප්‍රජාතනත්‍රවාදයේ මියගිය දරු උපත හා ආර්ථික පසුගාමිත්වය පිලිබඳ ප්‍රහේලිකාව සමඟ බැඳී ඇත. 1947 දී අධිරාජ්‍යවාදීන් විසින් ඉන්දු උප මහාද්වීපය වාර්ගිකව බෙදා වෙන් කිරීම හා ජෙනරාල් සියා උල් හක් යටතේ පකිස්ථානය යලි හැඩගැන්වීම ඒ දෙකයි.

ඇෆ්ගනිස්ථානයේ ඉස්ලාමීය මූලධර්මවාදී කන්ඩායම් සන්නද්ධ කරමින් හා උසිගැන්වීම මගින් සෝවියට් සංගමයට වල කැපීමේ එක්සත් ජනපද ව්‍යායාමයේ කේන්ද්‍රීය ලක්ෂය බවට එරට පත් කරමින් හා එක්සත් ජනපදය සමග සමීපව කටයුතු කරමින් සියා, පකිස්ථානු දේශපාලනය හා මිලිටරිය "ඉස්ලාමීයකරනය" කලේය.

දකුනු ආසියාවේ ඓතිහාසික හා සංස්කෘතික සම්ප්‍රධායන් කෙසේ වෙතත්, ආර්ථික හා භූගෝලීය තර්කනය පවා නොසලකමින් නිර්මානය කල පකිස්ථානය කෘත්‍රිම රාජ්‍යයකි. අධිරාජ්‍ය පාලනයේ බ්‍රිතාන්‍ය පද්ධතියට අයත් ප්‍රධාන අංග දෙකක් චිරස්ථායී කිරීම සඳහා එය සේවය කලේය. එනම් මුස්ලිම්වරු වෙනම දේශපාලන කන්ඩායමක් ලෙස රාජ්‍ය අනුග්‍රහය ඇතිව නිර්නය කිරීම හා බ්‍රිතාන්‍ය - ඉන්දියානු හමුදාවේ පංජාබීය ආධිපත්‍යය යි.

මෙසේ කීමේදී, ධනපති ඉන්දීය ජාතික කොංග්‍රසය (අයිඑන්සී) බෙදා වෙන්කිරීමේ වගකීමෙන් මුදාහරිනවා හෝ බ්‍රිතාන්‍ය ආධිපත්‍යයේ පදනම් මත කුමන හෝ මහා ඓතිහාසික නීත්‍යානුකූල භාවයක් සහිත ස්වාධීන ධනපති රාජ්‍යයක් ඉන්දියාව තුල නිර්මානය කල හැකිව තිබූ බවක් හෝ අදහස් කරන්නේ නැත.

වර්ගවාදී හින්දු මහා සභා හා රාෂ්ට්‍රීය ස්වයං සේවක් සංග් (ආර්එස්එස්) සමග නිහඬ එකඟතාවයක පසුවූ අයිඑන්සී ය, කම්කරු පන්තිය හා පීඩිත ගොවි ජනතාව ඉඩම් හිමි රදලවාදයට හා ධනවාදයට එරෙහිව බලමුලු ගැන්වීම තුලින් උප මහාද්වීපය පහල සිට ඒකාබද්ධ කිරීම මගින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී කුමන්ත්‍රන පරාජය කිරීමට ඓන්ද්‍රියව ම අසමත් හා අකමැති විය.

බෙදා වෙන්කිරීම, 20 වන සියවසේ මුල් භාගය තුල උප මහාද්වීපය වෙලාගෙන තිබූ අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය, අධිරාජ්‍යවාදී හා අභිලාෂවත් ඉන්දු පකිස්ථානු ජාතික ධනේශ්වරය විසින් පාගා මැඩීමේ වඩාත් දෘෂ්‍යමාන හා ලේවැකි ප්‍රකාශනය පමනි.

එය, තර්කාන්විත ආර්ථික වර්ධනයට මග අවුරමින් ද, දකුනු ආසියානු ජනතාව ප්‍රකාශිත යුද්ධ තුනකට ඇද දමමින් ද, රාජ්‍ය එදිරිවාදිකම් තුල වාර්ගික බෙදීම් නිදන් ගත කරමින් ද, රාජ්‍යයන් දෙකෙහි ම ධනපතියන්ට සමාජ අතෘප්තිය ස්වෝත්තමවාදය තුලට හරවා යැවීමට මග පැදුවේ අවසාන වශයෙන් දකුනු ආසියාව තුල අධිරාජ්‍යවාදී ආධිපත්‍යයට කොන්දේසි සැකසීය.

වෙනසකට ඇත්තේ නිදහසට පෙර මුස්ලිම් ලීගය විසින් උරුමකර දුන් ක්‍රියාකලාපය ඉදිරියට ගෙනයමින් පකිස්ථානු ධනපතියන්, සීතල යුද්ධයේ අවධිය තුල සිය ඉන්දියානු පසමිතුරන්ට වඩා නිහීන ලෙසත්, විවෘතවත් අධිරාජ්‍යවාදය සමග පෙලගැසීම පමනි. 1950 ගනන් මැද වන විට පකිස්ථානය, සෝවියට් සංගමය සමග ගැටුමේ දී වොෂින්ටන්හි පෙරමුනේ රාජ්‍යයක් බවට පත්ව තිබූ අතර පකිස්ථානු මිලිටරිය එක්සත් ජනපදයේ භූ දේශපාලන මූලෝපායේ කඩඅැනය බවට පත්වීමට සුදුසුකම් ලබමින් සිටියේය. 1958 දී හමුදා නායක අයුබ් ඛාන් බලය පැහැර ගන්නා විට, "අයික් (අයිසන්හවර්) අයුබ්ට කැමතියි" යන ආප්තය මගින් ද ප්‍රකාශ වන පරිදි, වොෂින්ටනයේ උද්යෝගිමත් සහයෝගය ඔහුට ලැබුනි.

1968-69 කම්කරු ශිෂ්‍ය ජනතා අරගල හා පකිස්ථානු සමූහාන්ඩුව තුල දෙවන තැන ලැබීම කෙරෙහි නැගෙනහිර පකිස්ථානය දැක්වූ විරුද්ධත්වය හමුවේ අයුබ්ඛාන් තන්ත්‍රය කඩාවැටීමෙන් පසුව, නික්සන් හා කිසිංජර්, බංග්ලාදේශය වෙන්වී යාම වැලැක්වීමේ ජනසංහාරයට අලුත් මිලිටරි කෙරුමා වූ යහියා ඛාන් දිරිගැන්වීය.

තෙවන ඉන්දු-පකිස්ථානු යුද්ධයේ දී පකිස්ථානය ලත් නින්දිත පරාජය හේතුකොට ගෙන පකිස්ථානු ප්‍රභුව හා වොෂින්ටනයට, අයුබ් ඛාන්ගේ හිටපු රැකවලෙකු හා ඉඩම් හිමි පවුලකින් පැවත එන භූටෝ වෙත නැඹුරු වීමට සිදුවිය. පකිස්ථානයේ තරයේ ම අසමාන වූ සමාජ පර්යාය හා මිලිටරිය කෙරෙහි පැවති මහජන විරෝධය දේශපාලනිකව අවමංගත කිරීම සඳහා භූටෝ, බොරු සමාජවාදී වාංමාලා හා ඉන්දියානු විරෝධී සවෝත්තමවාදය යොදා ගත්තේය.

වසර හයක පාලන කාලය තුල ඔහු විසංවාදී සමාජ බලවේගයන් අතර අඩමාන ලෙස සමබර වීමට වෑයම් කලේය. මිලිටරිය පුනරුත්ථාපනය කල ඔහු බලූකිස්ථානයේ ජාතිකවාදී කැරලි මැඩීමට එය යොදාගත් අතර පකිස්ථානය ඉස්ලාමීය සමූහාන්ඩුවක් ලෙස ප්‍රකාශයට පත්කරමින් එක්සත් ජනපද - පකිස්ථානු සන්ධානය පවත්වා ගත්තේය. කම්කරු පන්තියේ කුමන හෝ ස්වාධීන ක්‍රියාවක් රුදුරු ලෙස මඩිමින් ඔහු සීමිත සමාජ ප්‍රතිසංස්කරනද ක්‍රියාවට නැගීය. අවසාන වශයෙන් 1970 ගනන්වල දේශපාලනය ජාත්‍යාන්තරව ම දකුනට මාරුවීමත් සමග වොෂින්ටනයේ ද දිරිගැන්වීම් සහිතව ජෙනරාල් සියා යටතේ මිලිටරිය බලය අල්ලා ගත්තේය.

ඉන් පසුව පකිස්ථානයෙහි ඇතිවූ වර්ධනය කෙරෙහි සියා පාලන තන්ත්‍රය බිහිසුනු ප්‍රතිවිපාක ගෙන ආවේය. 1978-79 න් ඇරඹුනු වසර 11 ක පමන කාලය තුල, ඇෆ්ගන් මුජාහිඩීන් වරුනට එක්සත් ජනපද හා සවුදි මුදල් ද ආයුධ ද සපයන පීල්ලක් ලෙස ද සෝවියට් විරෝධී ඉස්ලාමීය බලවේග උසිගන්වමින් හා සංවිධානය කරමින් ඇෆ්ගන් සිවිල් යුද්ධයට එක්සත් ජනපදයේ මැදිහත් වීම සඳහා පිනුම් පිත්තක් ලෙස ද ඉස්ලමාබාදය වොෂින්ටනය විසින් යොදාගත්තේ ය. දේශීය වශයෙන් කම්කරු පන්තියට හා වාමාංශයට එරෙහිව තාප්පයක් ලෙස ඉස්ලාම් දක්ෂිනාංශය නගා

සිටුවීමටත්, රාජ්‍ය දෘෂ්ටිවාදය ලෙස ඉස්ලාම් මූලධර්මවාදය ප්‍රචලිත කිරීමේ තමාගේ ම වැඩ පිළිවෙල සඳහාත් සියා මෙය ආශීර්වාදයක් කොට ගත්තේය.

සියා පාලනයේ දක්ෂිනාංශික ආර්ථික ප්‍රතිපත්තීන්ට සමගාමීව, අධ්‍යාපනය හා අනෙකුත් මූලික සේවා සම්පාදනයෙන් රජය ඉවත්වන විට, ඇතිවූ හිඩැස පියවීමට ඉස්ලාමීය ආගමික ආයතන දිරිගන්වනු ලැබිනි.

අවසාන ප්‍රතිපලය වූයේ, ඉන්දියාව සමඟ පකිස්ථානයේ භූ දේශපාලනික ගැටුමේදී පකිස්ථානු ප්‍රභූවේ සියලු ම කොටස් විසින් යොදාගැනීමට උත්සාහ කල, ආගමික අපගාමීත්වය වැපිරීම, නිකායික ගැටුම් උත්සන්න කිරීම, වඩ වඩාත් සුලුජාතීන් මැඩීම හා මිලිටරිය ද සන්නද්ධ ඉස්ලාමීය කන්ඩායම් ද අතර පුරුකක් ගොඩ නැංවීම ද වේ.

සීතල යුද්ධය අවධියේ වොෂින්ටනය, පකිස්ථානයට සියලු වර්ගයේ අවි පද්ධතීන්ද ආයුධ ද විකුනමින් හා සපයමින්, ඉන්දියාව සමඟ පැවති ව්‍යසනකාරී පසමිතුරුකම්වල දී පකිස්ථානයට උල්පන්දම් දුන්නේය. එහෙත් සෝවියට් සංගමය බිඳවැටීමෙන් හා ඉන්දීය ධනේශ්වරය සිය ජාතික ආර්ථික පිළිවෙත ඉවතලීමෙන් පසුව ක්ලින්ටන් පරිපාලනය යටතේ එක්සත් ජනපදය ඉන්දියාව සමඟ නව මූලෝපායික හවුලක් තැනීමට යොමු විය.

එක්සත් ජනපද භූ දේශපාලනික මූලෝපාය තුල දැන් පකිස්ථානය දරන්නේ අඩු ප්‍රමුඛතාවක් වුවත්, පකිස්ථානු මිලිටරිය එම රාජ්‍යයේ රැකවලා මෙන්ම වටිනා වත්කමක් ද වන බව දැකගැනීමත් සමඟ, පෙන්ටගන්-පකිස්ථානු මිලිටරි හවුල දිගට ම පවත්වාගෙන යයි.

මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ තෙල් සම්පත් මත එක්සත් ජනපද අධිකාරය පිහිටුවා ගැනීම අරමුනු කොටගත් දැඩි ආක්‍රමනකාරී විදේශ පිළිවෙතකට මාරුවීම සඳහා බුෂ් පරිපාලනය, 2001 සැප්තැම්බර් 11 සිද්ධීන් අල්ලාගැනීමත් සමඟ, පෙන්ටගන්-පකිස්ථානු මිලිටරි බැඳීම්වලට නව ජීවයක් ලබාදෙමින් මුෂාරෆ් එක්සත් ජනපදයේ වඩාත්ම වැදගත් සගයෙක් ලෙස මතුවී ආවේය.

2001 සැප්තැම්බර් පටන් පකිස්ථානයට ඩොලර් බිලියන 10 ක් ලබාදී ඇති බව වොෂින්ටනය පිලිගන්නා අතර ඉන් වැඩි කොටසක් "ත්‍රස්තයට එරෙහි යුද්ධය" ට දෙන සහයෝගය සඳහා මිලිටරියට දෙන මිලිටරි ආධාර හා ගෙවීම්වල රූපයෙන් දී ඇත. එයට ප්‍රති උපකාර ලෙස මුෂාරෆ් තන්ත්‍රය, ඇෆ්ගනිස්ථාන් ආක්‍රමනය හා වාඩිලෑම සඳහා කේන්ද්‍රීය මෙහෙයුම් ආධාර සපයා ඇති අතර, රට තුල වධකාගාර පවත්වා ගැනීමටත්, දැන් ඉරානයට එල්ල කලහැකි ප්‍රහාරයක පුහුනු කටයුතු සඳහාත් එක්සත් ජනපද ආරක්ෂක හමුදාවන්ට ඉඩ සලසා දී තිබේ.

සති හයක හදිසි අවස්ථාවක් පනවමින් පසුගිය දෙමස පුරා මුෂාරෆ් තන්ත්‍රය යලිත් සිය දත් විලිස්සා ඇතත් එක්සත් ජනපදය පකිස්ථානය සමඟ සිය බැඳීම් තවදුරටත් ශක්තිමත් කරනු ලබයි.

පසුගිය සතියේ ඩිමොක්‍රටික් පක්ෂයේ පාලනය යටතේ පවතින කොන්ග්‍රසය. ඉස්ලමාබාදයට 2008 වසර සඳහා තවත් ඩොලර් මිලියන 785 ක් ආධාර ලෙස අනුමත කලේය. *වොෂින්ටන් පෝස්ට්* හා *නිව්යෝර්ක් ටයිම්ස්* වාර්තාවලට අනුව, මෑතකදී අත්සන් තැබූ එක්සත් ජනපද-පකිස්ථාන් ගිවිසුම යටතේ, "දේශීය ත්‍රස්ත මර්දන හමුදාවන් හා රහසිගත ත්‍රස්ත මර්දන ඒකක පුහුනු කිරීමේ හා ආධාර දීම" සඳහා එලඹෙන සතිවලදී පකිස්ථානය වෙත කිහිප සියයක විශේෂ හමුදාවන් පිටත්කර හරිනු ඇත. (දෙසැම්බර් 26 *වොෂින්ටන් පෝස්ට්*)

## කම්කරු පන්තිය හා පකිස්ථානයේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අරගලය

පකිස්ථානයේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අරගලය වනාහි, එක්සත් ජනපද අනුග්‍රහය හා මුදල් මත කටයුතු කරන මිලිටරි රාජ්‍ය පර්යායටත්, දකුනු ආසියාව තුල අධිරාජ්‍යවාදීන් ඇටවූ ජාතික රාජ්‍ය පද්ධතියටත් එරෙහි අරගලයකි. මූලික සිවිල් නිදහස සඳහා පමනක් නොව රැකියා, පොදු සේවා හා ග්‍රාමීය නිෂ්පාදකයා වෙනුවෙන් අරගලයට, එනම් ධනපති විරෝධී පෙරලිකාරී පියවර ගැනීම සඳහා පකිස්ථානු පීඩිත ජනතාව දේශපාලන ජීවිතය තුලට මැදිහත් වීම අවශ්‍ය කෙරේ.

අවසාන විග්‍රහයේ දී, පකිස්ථානු ධනේශ්වරය අති මූලික ප්‍රජාතන්ත්‍රීය සම්මතයන් පිලිපැදීමට පවා අසමත් වීම හා යලි යලිත් මිලිටරි පාලනයට හා ව්‍යවස්ථා විරෝධී පියවරයන්ට එල්බී ගැනීම මුල්බැස ඇත්තේ පකිස්ථානු සමාජය තුල ධනයේ ආන්තික ධ්‍රැවාන්ත ගත වීම ද, අධිරාජ්‍යවාදයට එහි යටත් වීම ද තුලය.

මැතිවරන වර්ජනයකට කැඳවුම් කල සුලුතර පක්ෂ ද ඇතුලත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විපක්ෂයේ කිසිදු කොටසක් අව්‍යාජ ලෙස ජනතාව ආමන්ත්‍රනය කිරීමට අකැමතිය, නැතහොත් අසමත්ය. සියල්ලටමත් වඩා කෘෂිකාර්මික කම්කරුවන් ද, බදු හා අඳ ගොවීන් ද ඇතුලත් රටේ ගොවි පීඩිතයන් හා කම්කරු පන්තියේ සමාජ ආර්ථික දුක් ගැනවිලි, මිලිටරි පාලනයට එරෙහි අරගලයට ඒකාබද්ධ කිරීමේ ලා එසේය.

භුටෝගේ ඝාතනය මඟින් පෙන්නුම් කලේ මෙයයි. පසුගිය වසර පුරා, එන්ට එන්ට ම මුෂාරෆ් පාලනය කෙරෙහි විරෝධය ප්‍රසිද්ධියේ පලවීමත් සමඟ, ආන්ඩුවට එරෙහි කිසිදු මහජන මැදිහත් වීමකට

තමන්ගේ විරුද්ධත්වය හුටෝ යලි යලිත් ප්‍රකාශ කලේ එය දේශපාලන ප්‍රභූවේ පාලනයෙන් ඉවතට යනු ඇතැයි බියපත් වීම නිසාය.

ධනපති විරුද්ධ පක්ෂ කඳවුරේ සියලු කොටස්, කම්කරු පන්තියට එරෙහිව තමන්ගේ ම පන්ති වරප්‍රසාද ආරක්ෂා කර ගැනීම සඳහාත්, අර්බුද ග්‍රස්ත පකිස්ථානු රාජ්‍යයේ භෞමික අඛන්ඩතාවය පවත්වා ගැනීම සඳහාත්, මිලිටරිය මත රැඳී සිටිති. තවද, ඔවුන් මූල්‍ය අන්තර් සම්බන්ධතා ජාලයකින් අධිරාජ්‍යවාදයට ගැටගැසී සිටිති. එහි ප්‍රතිඵල වශයෙන් ඔවුහු, මිලිටරි පාලනයට හා අධිරාජ්‍යවාදී ආධිපත්‍යයට එල්ල වූ අව්‍යාජ ජනතා අභියෝගයකට බියක් හා විරුද්ධත්වයක් දක්වති.

ගැඹුරුවන සමාජ අසමානතාවය, වැඩෙන විරැකියාව, ආහාර හා බලශක්ති හිඟය මෙන්ම මිල ඉහල යාම් ද කෙරෙහි වර්ධනය වන ජනතා අප්‍රසාදය හමුවේ ආඥාදායකත්වයට අභියෝග කිරීම සඳහා කිසිදු අයුරකින් ජනතාව කැඳවුම් කිරීමට ධනපති විපාර්ශවය වඩාත් මැලිවෙති. වරක් ඇවිස්සූ පසුව පකිස්ථානු පීඩිතයන්, තමන්ගේ ම වරප්‍රසාදවලට අභියෝගයක් වන පරිදි සමානාත්මතා අන්තර්ගතයක් සහිත ප්‍රජාතන්ත්‍රවාදය සඳහා හඬ නැඟීමට පටන්ගනු මිස, යලි තමා කලින් සිටිතැන්වලට ඉක්මනින් ම පසුබසිනු නැතැයි යන බියෙන් ඔවුහු ඇලලී සිටිති.

මුෂාරෆ් ආඥාදායකත්වය පෙරලා දමන හා ධනපති විපක්ෂයේ විනාශකාරී දේශපාලන ග්‍රහනය බිඳ දැමීම සඳහා ජනතාව බලමුලුගන්වන අරගලයේ කොටසක් ලෙස, කම්කරු පන්තිය හා සමාජවාදයට ලැදි ශිෂ්‍යයන් හා බුද්ධිමතුන්, සියලු දේශපාලන සිරකරුවන් වහාම නිදහස් කරන ලෙසත්, මාධ්‍ය සීමාවන් කටුගා දමන ලෙසත්, වැඩ වර්ජන හා දේශපාලන විරෝධතාවන් මත පනවා ඇති සියලු ම තහංචි ඉවත් කරන ලෙසත්, මුෂාරෆ් තන්ත්‍රය විසිරුවා හැර අව්‍යාජ මැතිවරන පවත්වන ලෙසත් ඉල්ලා සිටිය යුතුය.

එහෙත් එසේ කිරීමේ දී ඔවුන්, ලෝක අධිරාජ්‍යවාදයට හා එක්සත් ජනපදයට යටත්වූ ද, පකිස්ථාන් ධනවාදය දී ඇති දෙයක් ලෙස පිලිගන්නා වූ ද, ප්‍රජාතන්ත්‍රවාදය අල්ප සිවිල් නිදහසක් ලෙස සැලකීම දක්වා පහත හෙලන්නා වූ ද, ප්‍රජාතන්ත්‍රවාදය හා ව්‍යවස්ථාව පිලිබඳව පාලක පන්තිය ගෙන යන විවාදයේ සමස්ත රාමුව ම ප්‍රතික්ෂේප කල යුතු ය.

අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා, ඉඩම් හිමිකම දියකර හැරීම, එක්සත් ජනපදයේ අනුග්‍රාහී මිලිටරි-ආරක්ෂක රාජ්‍යය බිඳ විසිරුවා හැරීම, පල්ලිය රාජ්‍යයෙන් වෙන් කිරීම, රැකියා හා සියල්ලන්ට ම සුරක්ෂිත ආදායමක් ගෙන දෙන සමාජවාදී පියවර හා 1947-48 කාලයේ ඉන්දීය ජාතික කොන්ග්‍රසය හා මුස්ලිම් ලීගයේ නිහඬ අනුමැතිය සහිතව අධිරාජ්‍යවාදීන් දකුනු ආසියාව මත ඇටවූ වාර්ගික රාජ්‍ය පද්ධතිය පෙරලා දැමීම ඇවශ්‍ය ය. එය සාක්ෂාත් කල හැක්කේ, ධනවාදය පෙරලා දැමීමේ ජාත්‍යන්තර කම්කරු පන්ති අරගලය සමග පකිස්ථානයේ ද දකුනු ආසියාවේ ද පීඩිත ජනතාවගේ ඉරනම දැනුවත්ව බද්ධ කරන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක රූපයෙන් පමනි. මෙම අරගලය ඉදිරියට ගෙනයනු ලබන කම්කරු පන්තියේ නව විප්ලවවාදී පක්ෂයක් එනම් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ පකිස්ථානු ශාඛාවක්, සඳහා සටන ආරම්භ කරන ලෙස ලෝක *සමාජවාදී වෙබ් අඩවිය* පකිස්ථානයේ හා දකුනු ආසියාව තුල එහි පාඨකයන්ගෙන් හා ආධාරකරුවන්ගෙන් ඉල්ලා සිටියි.

එහෙත් එසේ කිරීමේ දී ඔවුන්, ලේක අධිරාජ්‍යවාදයට හා එක්සත් ජනපදයට යටත්වූ ද, පකිස්ථාන් ධනවාදය දී ඇති දෙයක් ලෙස පිලිගන්නා වූ ද, ප්‍රජාතන්ත්‍රවාදය අල්ප සිවිල් නිදහසක් ලෙස සැලකීම දක්වා පහත හෙලන්නා වූ ද, ප්‍රජාතන්ත්‍රවාදය හා ව්‍යවස්ථාව

පිලිබඳව පාලක පන්තිය ගෙන යන විවාදයේ සමස්ත රාමුව ම ප්‍රතික්ෂේප කල යුතු ය.

අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා, ඉඩම් හිමිකම දියකර හැරීම, එක්සත් ජනපදයේ අනුග්‍රාහී මිලිටරි-ආරක්ෂක රාජ්‍යය බිඳ විසිරුවා හැරීම, පල්ලිය රාජ්‍යයෙන් වෙන් කිරීම, රැකියා හා සියල්ලන්ට ම සුරක්ෂිත ආදායමක් ගෙන දෙන සමාජවාදී පියවර හා 1947-48 කාලයේ ඉන්දීය ජාතික කොන්ග්‍රසය හා මුස්ලිම් ලීගයේ නිහඬ අනුමැතිය සහිතව අධිරාජ්‍යවාදීන් දකුනු ආසියාව මත ඇටවූ වාර්ගික රාජ්‍ය පද්ධතිය පෙරලා දැමීම අවශ්‍ය ය. එය සාක්ෂාත් කල හැක්කේ, ධනවාදය පෙරලා දැමීමේ ජාත්‍යන්තර කම්කරු පන්ති අරගලය සමග පකිස්ථානයේ ද දකුනු ආසියාවේ ද පීඩිත ජනතාවගේ ඉරනම දැනුවත්ව බද්ධ කරන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක රූපයෙන් පමනි. මෙම අරගලය ඉදිරියට ගෙනයනු ලබන කම්කරු පන්තියේ නව විප්ලවවාදී පක්ෂයක් එනම් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ පකිස්ථානු ශාඛාවක්, සඳහා සටන ආරම්භ කරන ලෙස ලෝක *සමාජවාදී වෙබ් අඩවිය* පකිස්ථානයේ හා දකුනු ආසියාව තුල එහි පාඨකයන්ගෙන් හා ආධාරකරුවන්ගෙන් ඉල්ලා සිටියි.

© www.wsws.org